Khao San වලට සාපේක්ෂව ඒ ප්‍රදේශ යේ තදබදය ඉතා අඩු අතර ආහාර පාන පවා තත්වයෙන් ඉහළ බව මගේ පෞද්ගලික හැඟීමයි.

තායිලන්තයේදී තායි කඩ අත්හදා බලන්නටත් බොහෝ දෙනා ප්‍රිය කරන නිසා යන එන අතරමග Pad Thai (තායි නූඩ්ල්ස් බැදුම), Tom Yum Goong (ඉස්සො සුප්), Som Tum (තායි ගස්ලබු සලාදය), Khao Pad (තායි ෆ්‍රයිඩ් රයිස්) වැනි ආහාර වර්ග රස විඳින්නටත් අමතක කරන්නට එපා.

## දෙවන දිනය

දෙවන දිනය මා වෙන් කරන්නේ තායි ජනතාවගේ එදිනෙදා ජන ජීවිතය සහ නව බැංකොක් ජීවන රටාව අධ්‍යයනය කිරීමටයි. නවාතැනේදී ලබාගත් උදෑසන ආහාරයෙන් පසුව දවසේ ප්‍රථම ස්ථානය ලෙස Khlong Lad Mayom Floating Market කරා ගමන් කිරීමට ඔබට හැකියි. බැංකොක් නගරයෙන් මඳක් බැහැරව පිහිටියත් Floating Market තුනක් අතුරින් විශාලතම Market එක මෙයයි. එතරම් සංචාරකයන් බහුල නොවුනත් කලබලකාරී බැංකොක් නගරයෙන් මිදී පැය කිහිපයක් ගත කිරීමට ඔබට අවස්ථාව උදාවෙනවා. Silon line එකේ BTS එකට නැගී එහි අවසාන දුම්රිය ස්ථානයෙන් (Wongwian Yai) බැස ගැනීමෙන් අනතුරුව Taxi රථයකින් Floating Market එකට යාමට හැකිය. නැවුම් එළවළු, පළතුරු මෙන්ම මාළු ද මෙහි අලෙවි වෙනවා. තමන් මිලදී ගන්නා පළතුරු ආදිය වාඩි වී රස විඳීමට කුඩා බංකු පවා මේ අවට ඉදිකර තිබෙනවා. භූමියේ පිහිටා ඇති විවෘත වෙළඳපල පරිශ්‍රයෙන් නැවුම් එළවළු, පලතුරු මෙන්ම පිසින ලද ආහාර සහ තායි රසකැවිලි වර්ගද මිලදී ගත හැකිය.

දෙවන දිනයේ සවස් භාවය ඔබට බැංකොක් හි පිහිටි Siam Centre නැරඹීමට යා හැකිය. මේ අති විශාල වෙළඳ සංකීර්ණයේ ලෝක ප්‍රකට Brand Names වල රෙදිපිළි පමණක් නොව දේශීය සංස්කෘතික ඇඳුම්, ජාත්‍යන්තර අවන්හල් පවා පිහිටා තිබෙනවා Madame Tussauds Wax Museum සහ SEA LIFE Bangkok Ocean World මේ ප්‍රදේශයේ ඇති තවත් සුන්දර ස්ථාන දෙකක්.

## තුන්වන දිනය

### China Town

දින දෙකකට පසුව විඩාබර බවක් දැනෙන්නට හැකි නිසා අවසාන දිනය මධ්‍යාහ්නයට ආසන්නව ආරම්භ කරන්නට ඔබට පුළුවන්. එදින ප්‍රථම ස්ථානය ලෙස මා තෝරාගන්නේ බැංකොක් China Town එකට මෙය ලෝකයේ China Town අතර විශාලතම එකක් වන අතර මෙහිදී ඔබට සොයාගත නොහැකි ආසියානු ආහාර වර්ගයක් නොමැති තරම්. එමෙන්ම එකිනෙකට විවිධ වෙනස්කමින් යුතු ආගමික සිද්ධස්ථාන වලිනුත් මේ ප්‍රදේශයේ පිරී පවතිනවා. විශේෂයෙන්ම Wat traimit මේ ප්‍රදේශයේ මග නොහැරිය යුතු ස්ථානයක් ලෙස මා විශ්වාස කරනවා. මේ ප්‍රදේශයේ හොඳින් ඇවිදීමට පැය තුන හතරක් පවා ප්‍රමාණවත් නොවන තරම්.

### Chatuchak Weekend Market

ඉඩකඩ තිබුණහොත් සති අන්ත එකට පිවිසීමටත් අමතක කරන්න එපා. BTS එකෙන් MO Chit දුම්රිය ස්ථානයට පැමිණීමෙන් මේ Market එකට ළඟා විය හැකිය. රෙදි පිළි, අත්කම් භාණ්ඩ, නිවස සැරසිලි කරන විවිධ භාණ්ඩ, ආහාර පාන , පැළ වර්ග, සුරතල් සතුන්, කලා භාණ්ඩ, පොත් පත් හා විවිධ භාණ්ඩ වර්ග මෙහිදී ඉතාමත් අඩු මුදලකට මෙහිදී මිලදී ගත හැකිය.

ශ්‍රී ලාංකිකයන් වන අපට Tuk Tuk යන අරුමයක් නොවුනත් තායිලන්තයේදී ඔබ ලබාගන්නා Tuk Tuk අත්දැකීම ලංකාවට වෙනස් අත්දැකීමක් වන්නට පුළුවන්.

**අපි නැවත වතාවක් ආසියාවේ වෙනත් නගරයක සංචාරයකින් හමුවෙමු.**



China Town

Chatuchak Weekend Market

IMMIGRATION LAW @
Australian Immigration Law firm of the Sri Lankan Community

We are proud to have lead the way for others to follow...

Professional Immigration Legal Services
Legal Advice in simple to complex Immigration matters

- Skill Assessments
- State Sponsorships Expression of Interest (EOI)
- Visa Lodgments
- Employer Sponsorships & Nominations
- Migration Review Tribunal Appeals
- Federal Court Appeals
- Ministerial Appeals

General Skill Migration
457 Visas
Employer Nominated Migration
Student Visas
Graduate Skill Visas
Permanent Residence Pathways
Spouse Visas
Contributory Parent Visas
Business Migration
Resident Return Visas

A Team of Qualified & Experienced Lawyers & Registered Migration Agents

Susantha Katugampala
Principal
Barrister & Solicitor
Accredited Immigration Law Specialist
MARN: 9601070

LAW INSTITUTE OF VICTORIA ACCREDITED SPECIALIST

FAIRFIELDS LAWYERS

AUSTRALIA GATEWAY
Australian Immigration Law Advisory

10 Morrison Place
East Melbourne 3002
Australia
T: 03 9650 4557
1300 888 331
M: 0417 851 041

Suite 602, Hilton Colombo
Residence 200
Union Place, Colombo 2
Sri Lanka
T: +94 11 2300 627
M:+94 777 347 670

info@fairfieldslawyers.com

We Deliver Results...